කර්මාන්ත අමාත්‍යාංශය
கைத்தொழில் அமைச்சு
Ministry of Industries









# විදාතා

## කාර්ය සාධන විශ්ලේෂණ වාර්තාව

සැලසුම් අංශය - 2024

# විදාතා

## 1. හැඳින්වීම

### 1. 1 ආයතනයේ කෙටි හැඳින්වීම සහ ප්‍රධාන කාර්යභාරය

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින පර්යේෂණ ආයතනවලින් තාක්‍ෂණය, විද්‍යාත්මක දැනුම රටේ බිම් මට්ටමට ගෙනයාමේ අරමුණින් ජාතික වැඩසටහනක් ලෙස විදාතා වැඩසටහන 2000 වසරේ ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන මගින් රටේ නාගරික සහ ග්‍රාමීය ජනතාව අතර පවතින තාක්‍ෂණික හිඩැස පිරවීමට පහසුකම් සැලසෙන අතර අගය එකතු කිරීම තුළින් පවතින සම්පත් ඵලදායී ලෙස භාවිත කිරීම සඳහා ජනතාව දිරිමත් කරයි. එසේම, විදාතා වැඩසටහන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම හරහා රටේ ජාතික ආර්ථික සංවර්ධනයට දායක වේ.

2022.12.22 දිනැති අංක 2311/42 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව විදාතා වැඩසටහන කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ අදාල රාජකාරි සහ කාර්යයන් ඉටු කරයි.

### 1.2 ඉලක්ක

1. 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයේ නිෂ්පාදන කර්මාන්ත අංශයේ දායකත්වය 26% සිට 30% දක්වා ඉහළ නැංවීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට තාක්ෂණික වශයෙන් දායක වීම.
2. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ තරුණ හා කාන්තා ව්‍යවසායකත්ව දායකත්වය 2025 දී 20% දක්වා වැඩි කිරීමට දායක වීම.

### 1.3 අභියෝග

1. මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක: 02/2023 සහ 2023.02.02 දිනැති චක්‍රලේඛයේ මුදල් වියදම් කිරීම පිලිබඳ ඇතැම් කොන්දේසි නිසා, අග්‍රිම ලබා ගැනීම ප්‍රමාද වීම නියමිත ව්‍යාපෘතින්හි වැඩ අවසන් කිරීම ප්‍රමාද විය.
2. ප්‍රාදේශීය මට්ටමින් ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමේ ප්‍රායෝගික ගැටලු දිවයින පුරා ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා  ඍජු බලපෑමක් සිදු කිරීම.
3. නියමිත කාලසීමාව තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පාර්ශ්වකාර ආයතන සහයෝගීතාව ලබා ගැනීම.


## 3. ප්‍රගතිය

### 3.1 ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතිවල ප්‍රගතිය 2017 වසරේ සිට 2023 දක්වා

2017 සිට 2023 දක්වා වෙන් වූ ප්‍රතිපාදන සහ වියදම්

| අමාත්‍යාංශය | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | | | | වේවැල්, පිත්තල, මැටි , ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | අධ්‍යාපන අමාත්‍යාංශය | කර්මාන්ත අමාත්‍යාංශය | |
|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | **2017** | **2018** | **2019** | **2020** (අගෝස්තු දක්වා) | **2021** | **2022** | **2023** | **2024** |
| වෙන් වූ ප්‍රතිපාදන (රු.මි.) | 52.50 | 162.0 | 114.0 | 39.52 | 100.9 | 37.5 | 70.0 | 110.0 |
| වියදම (රු.මි.) | 47.63 | 141.86 | 98.36 | 7.08 | 100.53 | 37.46 | 44.68 | 4.74 |
| ප්‍රතිශතය (%) | 91% | 87% | 86% | 18% | 100% | 100% | 63.82% | 4.3% |

වගුව **-01**




| | 2017 | 2018 | 2019 | 2020 (Up to AUG) | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|
| වෙන් වූ ප්‍රතිපාදන | 52.5 | 162 | 114 | 39.52 | 100.9 | 37.5 | 70 | 110 |
| වියදම (රු.මි) | 47.63 | 141.86 | 98.36 | 7.08 | 100.53 | 37.46 | 44.68 | 4.74 |

**ප්‍රස්ථාර -01**

ප්‍රස්ථාර - 1 ට අනුව, ලැබුණු ප්‍රතිපාදනවලට සාපේක්ෂව 2017 සිට 2019 දක්වා වියදම් ප්‍රතිශතයක් ලෙස 91 සහ 86 අතර දෝලනය වූ නමුත් 2020 දී රටේ Covid 19 වසංගත තත්ත්වය සහ 2020 අගෝස්තුවෙන් පසුව සිදු වූ නව අමාත්‍යාංශ ව්‍යුහමය වෙනස්වීම් හේතුවෙන් ප්‍රතිපාදන හා වියදම් අවම විය. නැවතත්, Covid 19 බලපෑම් සහ ආර්ථික අර්බුදය හේතුවෙන් 2022 දී එය අවම විය. තවද 2022 දී චක්‍රලේඛ උපදෙස් මගින් ප්‍රතිපාදන සීමා පනවා ඇති අතර 2022 ට සාපේක්ෂව 2023 දී ප්‍රතිපාදන හා වියදම් ඉහළ මට්ටමක පවතින නමුත් අයවැය චක්‍රලේඛ වලින් පනවන ලද බාධා කිරීම් සහ සීමා කිරීම් නිසා අග්‍රිම ලබා ගැනීමේ ප්‍රමාදය 2022 ට සාපේක්ෂව අඩු මූල්‍ය ප්‍රගතියක් ඇති කිරීමට හේතු විය.

### 3.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අංශ- 2017-2023

1. නිෂ්පාදනවල තත්ත්ව උසස් කිරීම සහ ප්‍රමිතිකරණය (GMP, VSC සහතිකකරණ වැඩසටහන)
2. ව්‍යවසායකයින් සඳහා වෙළඳපල සහ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්.
3. ජීවනෝපාය උපාය මාර්ග වැඩිදියුණු කිරීම
    - අ) එක් ගමක් ව්‍යාපෘතියක් සඳහා එක් ව්‍යවසායකයෙක්
    - ආ) ශ්‍රී ලංකාව තුළ ත්‍රිරෝද රථ රියදුරන් නැවත සේවයේ යෙදවීම.
4. තාක්ෂණ සම්ප්‍රේෂණ වැඩසටහන්
    - අ) ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික හුවමාරු වැඩසටහන්
    - ආ) විද්‍යාතා ඒකක කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධන

### 3.1.1 1. නිෂ්පාදනවල තත්ත්ව උසස් කිරීම සහ ප්‍රමිතිකරණය (GMP, VSC සහතිකකරණ වැඩසටහන)

ග්‍රාමීය මට්ටමේ සිට වෙළෙඳපොළට ළඟා වන ගුණාත්මක නිෂ්පාදන සහතික කිරීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය (ITI) සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) සමඟ එක්ව පරීක්ෂණ වාර්තා සහ තත්ත්ව සහතික නිකුත් කිරීමට විදාතා ඒකකයේ සම්බන්ධීකරණය යටතේ සිදු කරනු ලබයි. එක් ව්‍යවසායකයෙකු සඳහා සහතික කිරීමේ ක්‍රියාවලිය සඳහා වන මුළු වියදමෙන් 75%ක් විදාතා ඒකකයෙන් දරන අතර ඉතිරි 25% ව්‍යවසායකයා විසින් දරාගත යුතු වේ.

| ආයතනය | 2021 | | | 2022 | | | 2023 | | | 2024 (ඉලක්ක) | | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | තත්ව පරීක්ෂණ වාර්තා | සහතික | | තත්ව පරීක්ෂණ වාර්තා | සහතික | | තත්ව පරීක්ෂණ වාර්තා | සහතික | | තත්ව පරීක්ෂණ වාර්තා | සහතික | | තත්ව පරීක්ෂණ වාර්තා | සහතික | |
| | | GMP | VSC | | GMP | VSC | | GMP | VSC | | GMP | VSC | | GMP | VSC |
| කාර්මික තාක්ෂණ ආයතනය | 319 | - | - | 268 | - | - | - | - | - | | | | 787 | 318 | |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | - | 18 | 00 | - | 15 | 02 | - | 08 | 00 | 200 | 275 | | | | |
| වෙනත් ආයතන | - | - | - | - | - | - | - | - | - | | | | | | |
| මුළු එකතුව | **319** | **18** | | **268** | **17** | | **00** | **08** | | **200** | **275** | | **1105** | | |

වගුව 2- නිකුත් කරන ලද තත්ත්ව පරීක්ෂණ වාර්තා සහ ප්‍රමිති සහතික පිළිබඳ විස්තර (ආහාර, ශාකසාර සහ රසායනික තාක්ෂණය)

### 3.1.2 ව්‍යවසායකයින් සඳහා වෙළඳපල සහ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්

දිවයින පුරා විසිරී සිටින ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපල සහ අලෙවි ප්‍රවර්ධන අවස්ථා හඳුන්වා දීම තුලින් ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම සහ එමඟින් දේශීය හා ගෝලීය වෙළඳපල තුළ ප්‍රචලිත ව්‍යවසායකයින් ලෙස ක්‍රමයෙන් ශක්තිමත් වගබලා ගනිමින් ඔවුන්ගේ ආදායම ඉහළ නැංවීම මෙම වැඩසටහනේ අරමුණයි.

| අනු අංකය | වර්ෂය | වැඩසටහනේ නම | ඉලක්කගත වැඩසහන් සංඛ්‍යාව | අවසන් කල වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. | 2022 | හරිත කඩමණ්ඩිය වැඩසටහන | 25 | 11 | 592 |
| 2. | | ග්‍රාමීය කර්මාන්තකරුවන් සඳහා අලෙවිකරණ අවස්ථා නිර්මාණය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සතිපොළ පැවැත්වීම | 200 | 283 | 3370 |
| 3. | | නාරාහේන්පිට "රජවාස" පරිශ්‍රය කේන්ද්‍ර කර ගනිමින් දේශීය අලෙවි අවස්ථා නිර්මාණය කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම සහ දිස්ත්‍රික් මට්ටමින් අලෙවි දාම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණය සැපයීම. | 25 | 25 | 1236 |
| **එකතුව 1** | | | **250** | **319** | **5198** |
| 4. | 2024 | දිස්ත්‍රික් මට්ටමේ වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්වීම | 25 | 03 | 88 |
| **මුළු එකතුව** | | | **275** | **322** | **5286** |

**වගුව 3- ව්‍යවසායකයින් සඳහා වෙළඳපල සහ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය**

### 3.1.3 ජීවනෝපාය උපාය මාර්ග වැඩිදියුණු කිරීම

**• එක් ගමකට එක් ව්‍යවසායකයෙක් (ව්‍යවසායකත්වය ඇති කිරීම)**

ග්‍රාමීය කර්මාන්ත සඳහා එක් ගමකට එක් ව්‍යවසායකයෙකු බිහි කිරීමේ අරමුණින් මෙම වැඩසටහන 2021 වසරේ ප්‍රධාන ජාතික වැඩසටහන ලෙස ආරම්භ කරන ලදී. මෙම ව්‍යවසායකයින් ඔවුන්ගේ නිෂ්පාදන සඳහා උපකරණ සැපයීම, තාක්ෂණික සහාය, නව තාක්ෂණයන් පිළිබඳ පුහුණුව සහ තත්ත්ව සහතික ලබා දීම තුළින් නඟා සිටුවීමට කටයුතු කරන ලදී. මෙමගින් අපනයනය ඉලක්ක කරගත් කර්මාන්ත ඇති කිරීම, කලාපීය විෂමතා අවම කිරීම, ග්‍රාමීය කර්මාන්තවල ආදායම වැඩි කිරීම, නවීන යන්ත්‍ර සූත්‍ර හරහා ග්‍රාමීය නිෂ්පාදන වැඩිදියුණු කිරීම, තාක්ෂණය, අගය එකතු කිරීම සහ නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම ප්‍රධාන අපේක්ෂිත ප්‍රතිඵල විය.

| අනු අංකය | වර්ෂය | ක්‍රියාකාරකම | කර්මාන්ත අංශය | ප්‍රතිලාභීන් ගණන | ලබා දී ඇති තත්ව පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව/ තත්ව සහතික සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | | | | | තත්ව පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව/ | තත්ව සහතික සංඛ්‍යාව |
| 01. | 2021 | නවීන තාක්ෂණය සම්ප්‍රේෂණය කිරීම සඳහා සහාය | • ආහාර<br>• ශාකසාර,<br>• රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත,<br>• පොල්, තල්, කිතුල් ආශ්‍රිත හස්ත කර්මාන්ත<br>• ගෘහාශ්‍රිත. | 10871 | 82 | 12 |
| 02 | 2022 | තත්ත්ව සහතික සහ ප්‍රමිති සහතික නිකුත් කිරීම | | | | |

වගුව 4- එක් ගමකට එක් ව්‍යවසායකයෙක් වැඩසටහනේ ප්‍රගතිය

- **ශ්‍රී ලංකාවේ ත්‍රිරෝද රථ රියදුරන්ට නව ජීවනෝපාය අවස්ථා හඳුන්වාදීම- 2023-2024**

| වර්ෂය | ක්ෂේත්‍රය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | ගම්පහ | ගාල්ල | හම්බන්තොට | කොළඹ | යාපනය | |
| **2023** | ජලනල කාර්මික | 00 | 00 | 00 | 20 | 19 | 39 |
| | කොණ්ඩා කැපීම | 103 | 40 | 00 | 00 | 00 | 143 |
| | ඉලෙක්ට්‍රික් කාර්මික | 92 | 48 | 00 | 18 | 18 | 176 |
| **2024 (ඉලක්කය)** | ජලනල කාර්මික | - | - | - | - | - | |
| | කොණ්ඩා කැපීම | 42 | - | - | - | - | |
| | ඉලෙක්ට්‍රික් කාර්මික | 60 | - | - | - | - | |
| **එකතුව 1** | | **279** | **88** | **00** | **38** | **37** | **460** |

| වර්ෂය | ක්ෂේත්‍රය | දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | ගම්පහ | ගාල්ල | හම්බන්තොට | කොළඹ | යාපනය | එකතුව |
| 2023 | ජලනල කාර්මික | 00 | 00 | 00 | 1 | 1 | 2 |
| | කොණ්ඩා කැපීම | 5 | 2 | 00 | 00 | 00 | 7 |
| | ඉලෙක්ට්‍රික් කාර්මික | 5 | 3 | 00 | 1 | 1 | 10 |
| 2024 (ඉලක්කය) | ජලනල කාර්මික | - | - | - | - | - | |
| | කොණ්ඩා කැපීම | 03 | - | - | - | - | |
| | ඉලෙක්ට්‍රික් කාර්මික | 03 | - | - | - | - | |
| එකතුව 2 | | **16** | **5** | **00** | **2** | **2** | **25** |

වගුව **5 -** ත්‍රිරෝද රථ රියදුරන්ට නව ජීවනෝපාය අවස්ථා හඳුන්වාදීමේ වැඩසටහනේ ප්‍රගතිය

### **3.1.4.** තාක්ෂණික සම්ප්‍රේෂණ වැඩසටහන්

• දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන හරහා සිදු කරන මූල්‍ය නොවන පුහුණු වැඩසටහන්

| අනු. අංකය | වර්ෂය | ක්ෂේත්‍රය | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | 2022 | ආහාර නිෂ්පාදන, රසායන ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන, අලෙවිකරණය, දැනුවත් කිරීම් | 1257 | 19261 |
| 02 | 2023 | | 14297 | 194289 |
| 03 | 2024 (මැයි දක්වා) | | 704 | 14646 |

වගුව **6 -** මූල්‍යමය නොවන පුහුණු වැඩසටහන් පැවැත්වීමට අදාල තොරතුරු

- **වෙනත් තාක්ෂණ සම්ප්‍රේෂණ වැඩසටහන්**

| අ.අ. | තාක්ෂණ සම්ප්‍රේෂණ වැඩසටහන් | 2021 ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 2022 ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 2023 ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 2024(ඉලක්කය) ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. | ව්‍යවසායකයින් සඳහා තාක්ෂණි සම්ප්‍රේෂණ වැඩසටහන් | | | | |
| | 1.1 ග්‍රාමීය ව්‍යවසායකයින්ට තාක්ෂණික සහාය ලබා දීම සහ තාක්ෂණ හුවමාරු වැඩසටහන් පැවැත්වීම | 514 | | | |
| | 1.2 තාක්ෂණික සායන සත්කාර වැඩසටහන පැවැත්වීම | | 135 | | |
| | 1.3 ආතර් සී ක්ලාක් ආයතනය සමඟ ව්‍යවසායකයින් සහ තරුණයින් සඳහා පරිගණක දෘඩාංග, ඉලෙක්ට්‍රොනික පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම | | | 250 | 500 |
| | 1.4 ක්ෂුද්‍ර හා කුඩා ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | | | 609 | |
| | 1.5 ඇඟලුම් ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය සමඟ පුහුණු වැඩසටහනක් පැවැත්වීම | | | 91 | 400 |
| | **එකතුව** | 514 | 135 | 950 | 900 |
| 2 | විද්‍යාතා ඒකක කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. | | | | |
| | 2.1දිස්ත්‍රික් විද්‍යාතා නිලධාරීන් සහ විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන භාර නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 513 | | | |
| | 2.21 දිස්ත්‍රික් විද්‍යාතා නිලධාරීන් සහ විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන භාර නිලධාරීන් සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කිරීම පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. | | 97 | 200 | 365 |
| | **එකතුව** | 513 | 97 | 200 | 365 |
| | **මුළු එකතුව** | **1027** | **232** | **1150** | **1265** |

**වගුව 7 - තාක්ෂණ සම්ප්‍රේෂණ වැඩසටහන් සිදු කිරීමෙහි ප්‍රගතිය**

**4. ඉහත දත්ත සහ තොරතුරු මත පදනම්ව ආයතනයේ පවත්නා තත්ත්වය පිළිබඳ නිරීක්ෂණ**

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට තම කර්මාන්ත දියුණු කිරීමට සහ ව්‍යවසායකත්වය වර්ධනය කිරීමට අවශ්‍ය තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂ වූ එක් රාජ්‍ය ආයතනයක් ලෙස විදාතා ඒකකය එහි ඇති සම්පත් ප්‍රශස්ත මට්ටමින් භාවිතා කරමින් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇත. 2020, 2021,2022 සහ 2023 වසරවලදී කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් අයවැය චක්‍රලේඛ හරහා ප්‍රාග්ධන වියදම් සීමා කිරීම හේතුවෙන් ඉලක්කගත නිමැවුම සාක්ෂාත් කර ගැනීම අපහසු විය. අනෙක් නව තාක්ෂණය, තාක්ෂණික සහය, මූල්‍ය ආධාර සහ තත්ත්ව වැඩිදියුණු කිරීම් මගින් ව්‍යවසායකයින් ශක්තිමත් කිරීමට සහ සවිබල ගැන්වීමට මෙම අංශය සමත් වී ඇත.

**5. ආයතනය මුහුණ දෙන  අභියෝග සහ එහි අභිවෘද්ධිය සඳහා යෝජනා**

විදාතා අංශය මඟින් පුහුණුව ලබා ඇති ව්‍යවසායකයින් අධීක්‍ෂණය කිරීමට ශක්තිමත් අධීක්ෂණ ක්‍රියා පටිපාටියක් නිර්මාණය කිරීම, ඒකකයෙහි සංවර්ධන වැඩසටහන් පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම සහ එය යාවත්කාලීන කිරීම විදාතා අංශයේ අභිවෘද්ධිය සහ ස්ථාවරත්වය සඳහා වැදගත් වේ.